# ළමාවිය නියොමොකොකල් රෝගය

Sinhalese

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන (National Immunisation Program) මගින් වයස මාස දෙක, හතර සහ 12 දී සියළුම ළදරුවන් හට නොමිළේ නියුමොකොකල් එන්නත ලබාදේ. වයස අවුරුදු පහට අඩු වෙනත් වෛද්‍ය තත්වයන් ඇති දරුවන්ද අමතර නියුමොකොකල් එන්නත් මාත්‍රා සඳහා සුදුසුකම් ලබයි.

## නියුමොකොකල් ආසාදනය

කුඩා දරුවන් අතර නියුමොකොකල් ආසාදනය මගින් රුධිර ආසාදන සහ මරණය වැනි දරුණු තත්වයන් ඇතිවිය හැකිය. දරුණු වෛද්‍ය තත්වයක් ඇති දරුවකු ජීවිත තර්ජන ආසාදන සහ රෝහල්ගත කිරීම සම්බන්ධ වඩා දරුණු අවදානම් දරයි.

බොහෝ අයගේ නාසයේ සහ උගුරේ ස්ට්‍රෙප්ටොකොකස් නියුමෝනියේ (Streptococcus pneumoniae) බැක්ටීරියාව ඇත. බැක්ටීරියාව පැතිරෙන්නේ කැස්ස සහ කිවිසුම් මගින් කටෙහි සහ නාසයේ ඇති දියබිඳිති මගින් හෝ ආසාදනය වුණු දියබිඳිති තැවරුණු දේවල් ඇල්ලීම මගිනි.

නියුමොකොකල් ආසාදන සිරුරේ විවිධ කොටස් ආසාදනය කෙරේ. උදාහරණ වශයෙන්:

- නියුමොකොකල් බැක්ටීරියාව රුධිර ප්‍රවාහයට ඇතුළුවුවහොත්, එය බැක්ටීරීමියා (bacteraemia) ලෙස හඳුන්වයි
- එය මොළයේ විශේෂිත කොටසක් ආසාදනය වුවහොත්, එය මෙනින්ජයිටිස් (meningitis) ලෙස හඳුන්වයි
- නියුමොකොකල් බැක්ටීරියාව පෙනහළු ආසාදනය වුවහොත්, එය නියුමෝනියා (pneumonia) ලෙස හඳුන්වයි
- එය මැද කන ආසාදනය වුවහොත්, එය ඕටිටිස් මීඩියා (otitis media) ලෙස හඳුන්වයි.

## නියුමොකොකල් එන්නත්

දරුණු නියුමොකොකල් ආසාදනවලට එරෙහිව දරුවන් සඳහා ඇති එන්නතක් සියයට සියයක් සාර්ථක බව පෙන්වාදී ඇත. කෙසේවුවද, නියුමොකොකල් ආසදන විශේෂ 90කට වැඩි ප්‍රමාණයක් ඇත. එක් නියුමොකොකල් එන්නතක් මගින් දරුණු නියුමොකොකල් ආසාදන සියයට 80 සිට 90 දක්වා ප්‍රමාණයක් ආවරණයවේ. දරුවා හට වෙනත් වෛද්‍ය තත්වයක් ඇතිනම්, වඩා වයසින් වැඩි දරුවන් සඳහා සුදුසු වෙනත් නියුමොකොකල් එන්නතක් ලබාදේ. මෙයට හේතුව නියුමොකොකල් ආසාදන වැඩි ප්‍රමාණයකින් ආරක්‍ෂා කිරීමේ හැකියාව එය සතුව තිබීමයි.

එන්නත්වල සමහර නියුමොකොකල් බැක්ටීරියා විශේෂවල අක්‍රීය අංග අඩංගුවන අතර මේ මගින් ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාරයක් උත්තේජනයවේ.

## නොමිළේ ලබාදෙන එන්නත ලබා ගැනීමට සුදුසුකම් ඇත්තේ කවුරුන් හටද?

- වයස අවුරුදු දෙකේ, හතරේ සහ මාස 12හේ ළදරුවන්
- වයස අවුරුදු පහ දක්වා ඇති නියුමොකොකල් ආසාදනය සම්බන්ධ වැඩි අවදානම ඇති වෛද්‍ය අවදානම් සාධක ඇති දරුවන්. මෙම දරුවන් හට වයස මාස හයේදී සහ අවුරුදු හතර සිට පහ දක්වා නියුමොකොකල් එන්නතෙහි අමතර මාත්‍රා අවශ්‍යවේ.

පහත ආකාරයේ අමතර වෛද්‍ය තත්වයන් සම්බන්ධව ඔබගේ වෛද්‍යවරයා සමග කථා කරන්න:

- HIV ආසාදන
- රුධිර මාත්සර්ය (blood malignancies)
- සිස්ටික් ෆිබ්‍රෝසිස් (cystic fibrosis)
- CSF කාන්දුවීම (CSF leak)
- අන්තඃ කපාල උපපථය (intracranial shunt)
- මැදකන ආරෝපණය (cochlear implants)
- අසනීප, බෙහෙත් හෝ ප්‍රතිකාර මගින් ඇතිවන ප්‍රතිශක්ති ඌනතාව (immune deficiency)
- ප්ලීහාවේ ක්‍රියාකාරිත්වය අඩපණවීම හෝ ප්ලීහාවක් නොමැතිවීම
- ඩවුන් සින්ඩ්‍රෝමය (Down syndrome)
- සති 28කට වඩා අඩු ගැබ් කාලයකින් උපන් සියළුම ළදරුවන්
- හෘදය වස්තුව, පෙනහළු, වකුගඩුවල නිදන්ගත ආසාදන සහ දියවැඩියාව.

## නියුමොකොකල් එන්නතෙහි අතුරු ආබාධ

### බහුල අතුරු ආබාධ

- එන්නත් කල ප්‍රදේශයේ වේදනාව, රත් පැහැවීම සහ ඉදිමුම
- තරමක උණ ගතිය

### ඉතා විරල අතුරු ආබාධ

- දරුණු අසාත්මිකතා ප්‍රතිචාර.

තරමක ප්‍රතිචාර ඇතිවුවහොත්, පහත ආකාරයට අතුරු ආබාධ අඩුකර ගත හැකිය:

- එන්නත් කල ප්‍රදේශයේ තෙත රෙද්දක් තැබීම මගින්

VICTORIA State Government | Health and Human Services

- ඔබගේ දරුවාට වැඩියෙන් ඇඳුම් ඇන්දවීමෙන් වැළකීම
- අපහසුතාව සහ/හෝ අධික උණ අඩු කිරීමට පැරසිටමෝල් අවශ්‍ය විය හැකිය (නිවැරදි භාවිතය සඳහා ලේබලය කියවන්න)
- ඔබගේ දරුවාට පානයට අමතර බීම දීම

ප්‍රතික්‍රියා දරුණු සහ එක දිගට පවතී නම්, හෝ ඔබගේ දරුවා සම්බන්ධයෙන් ඔබ කණස්සල්ලෙන් සිටීනම්, ඔබගේ වෛද්‍යවරයා හමුවන්න, නැතිනම්, රෝහල වෙත යන්න.

## එන්නත් කිරීමට ප්‍රථම සෝදිසි ලැයිස්තුව

ඔබගේ දරුවාව ප්‍රතිශක්තිකරණය කිරීමට පෙර, ඔබගේ දරුවාට පහත යමක් ඇතිද යන්න වෛද්‍යවරයාට හෝ හෙදියට පවසන්න:

- ☐ එන්නත දෙන දිනයේදී අසනීප ගතිය
- ☐ කිසියම් එන්නතකට දරුණු ප්‍රතිචාර ඇතිව තිබීම
- ☐ එන්නතෙහි කිසියම් කොටසකට අසාත්මිකතාවයක් තිබීම

## වැඩිදුර විස්තර

වැඩිදුර විස්තර සඳහා www.betterhealth.vic.gov.au හි 'childhood immunisation' සොයන්න.

මෙම ලේඛණයේ පරිවර්තනයක් සඳහා www.healthtranslations.vic.gov.au වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන සම්බන්ධ තොරතුරු සඳහා www.immunise.health.gov.au/ වෙබ්අඩවිය වෙත පිවිසෙන්න.

© ප්‍රකාශන අයිතිය සෞඛ්‍යය දෙපාර්තමේන්තුව සතුය 2010. බලය ලබා දුන්නේ 50, ලොන්ස්ඩේල් වීදිය, මෙල්බර්න් හි පිහිටි වික්ටෝරියානු ප්‍රාන්ත රජය මගිනි.
ඔක්තෝබර් 2018. PH616 (1011012)

**Translating and interpreting service**
**Call 131 450**